**ශීර්ෂය 269 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 15 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය  මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික පනතේ 6 (I) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබදව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **ගිණුම්කරන අඩුපාඩු**

**(අ)** **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ වාර්තාවට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 24 ක් හදුනාගෙන එහි වටිනාකම රු. මිලියන 559 ක් ලෙස මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දක්වා තිබුණ ද මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ එම වටිනාකම රු.මිලියන 487 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 72 ක වෙනසක් නිරීක්ෂණය විය. | දැන් මෙම ගැටළු විසඳීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධීකරණය කිරීමට අතිරේක දිසාපති (ඉඩම්) වෙත උපදෙස් ලබා දී ඇත. | ඉඩම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතුයි |

**(ආ)** **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු අතර, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. කෙසේවෙතත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට කිසිදු ප්‍රකාශනයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ගයක් මගින් මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 100 ක් වෙන්කර තිබූ අතර ඉන් රුපියල් මිලියන 38 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව රුපියල් මිලියන 62 ක ඉතිරියක් විය. | රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් අවශ්‍ය උපකරණ ලබාගැනීමේ අපහසුතා ඇතිවීම. | මූල්‍ය වර්ෂය තුළ ව්‍යාපෘති ඉලක්ක සපුරාලීමට කටයුතු කළ යුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් විවිධ කාර්යයන් සඳහා ලබා දුන් ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේ දී රුපියල් මිලියන 186 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 51 සිට සියයට 97 දක්වා පරාසයක පැවතුනි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ගමන් වියදම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වූ ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගෙන නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වෙන්කර තිබූ රු.මිලියන 9.9 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන වර්ෂ 2 සිට වර්ෂ 5 ක් දක්වා කාලයක් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබිණි. | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතර තුළ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | අංක 571 දරන මුදල් රෙගුලාසිවල විධිවිධානවලට අනුව තැන්පතු පියවීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඉඟුරු වගාව සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අටකට රුපියල් මිලියන 9.9 ක ප්‍රතිපාදන යටතේ ප්‍රතිලාභීන් 767 දෙනෙකු සඳහා ලබා දී ඇති රුපියල් මිලියන 7.4 ක ඉඟුරු කිලෝග්‍රෑම් 12,385 ක්, ඉඟුරුවල ගුණාත්මකභාවය අඩුවීම සහ ගංවතුර හේතුවෙන් හානි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | ඉඟුරු වල ප්‍රමිතිය කෘෂිකර්ම ක්ෂේත්‍ර උපදේශක විසින් සහතික කර ඇත. අධික වර්ෂාව හේතුවෙන් ඉඟුරුවලට හානි සිදුවී ඇත. | ගුණාත්මක භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක් අතර බෙදා හැරීම සඳහා එළුවන් 1,351ක් මිලදී ගෙන තිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක ප්‍රතිලාභීන්ට ලබා දුන් රු.823,000 ක් වටිනා එළුවන් 823 ක් ප්‍රතිලාභීන්ට ලබා දීමට පෙර රක්ෂණය කළ යුතුව තිබුණද එලෙස රක්ෂණය කර නොතිබුණි. තවද, රු.මිලියන 19.86 ක වියදමින් මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදා දුන් එළුවන් 1,351 න් රු. මිලියන 2.85 ක් වටිනා එළුවන් 194 ක් මිලදී ගත් දින සිට මාසයත් මාස තුනත් අතර කාලයක් තුළ මිය ගොස් තිබුණු අතර එම එළුවන් රක්ෂණය නොකිරීම හේතුවෙන් සිදුවූ පාඩුව අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රතිපාදන හිඟය හේතුවෙන් එළුවන් බෙදාහැරීම් රක්ෂණය කිරීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් දී ඇත. | අරමුණු ඉටුකර ගත හැකි පරිදි කාර්යක්ෂමව කටයුතු කළ යුතුය. |

### 3.2 මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොමැති ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් මාර්ග ඉදිකිරීම් 18ක් සඳහා කාත්තන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රුපියල් මිලියන 16 ක් වෙන් කර තිබුණද රුපියල් මිලියන 3.7 ක වියදමින් මාර්ග ඉදිකිරීම් 04 | විශේෂයෙන් කාත්තන්කුඩි පාර ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අන්තර්ජාල පැකේජය අමාත්‍යාංශය විසින් වර්ෂය අවසානයේ ලැබීමට හේතු විය. | ප්‍රතිපාදන ආර්ථිකව හා කාර්යක්ෂමව භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |

ක් පමණක් සිදු කර තිබුණු අතර මාර්ග 14 ක් ඉදි කර නොතිබුණි. ඒ අනුව රුපියල් මිලියන 12 ක මුදලක් අපේක්ෂිත කාර්යයන් සඳහා යොදා නොගෙන නැවත අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.

**3.3 හානි හා පාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රුපියල් මිලියන 7.2 දක්වා වූ අලාභ අතරින්, අවස්ථා 15කදී සිදු වූ රුපියල් මිලියන 2.1ක අලාභ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර අවස්ථා 6 කදී සිදුවී ඇති රුපියල් මිලියන 1.4 ක අලාභ සිදුවී වර්ෂ 2 සිට 7 දක්වා කාලය ගතවී තිබුණද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුවෙමින් පවතී. | මුදල් රෙගුලාසි 102 සිට 110 ට අනුකූලව හානි සහ පාඩු අයකරගත යුතුය. |

**3.4 ආර්ථික නොවන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මඩකලපුව දුම්රිය හරස් මාර්ගය දීර්ඝ කිරීම සඳහා 2019 සහ 2020 වර්ෂවලදී මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මඩකලපුව මහ නගර සභාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම කොන්ත්‍රාත්තුව වෙනුවෙන්, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩිපුර ගෙවන ලද රු. 309,304 ක් 2022 ජූනි වන විටත් අයකරගෙන නොතිබුණි. තවද, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඩකලපුව මහ නගර සභාව සමඟ කරන ලද සිවිල් කොන්ත්‍රාත්තු 23 කට අදාලව වැඩිපුර ගෙවන ලද රු.මිලියන 1.47 ක් අයකරගෙන ද නොතිබුණි. | මීළඟ මූල්‍ය කමිටු රැස්වීමට අනුව එම ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 9.7 ක් වටිනා චෙක්පත් 13 ක් සැපයුම්කරුවන් නමට ලියා තිබුණද එම ඇණවුම් කළ භාණ්ඩ 2022 අප්‍රේල් 20 වන දින දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ට ලැබී නොතිබුණි. මේ අනුව භාණ්ඩ ලැබීමට ප්‍රථමව ගෙවීම් සිදු කිරීමෙන් මූල්‍ය කළමනාකරණයේ අක්‍රමිකතා සහ අවිධිමත් ක්‍රියාවන් සඳහා අවස්ථා පැදීමට ඉඩකඩ තිබුණි. | ආර්ථික අර්බුදය, වෙළෙඳපොළේ භාණ්ඩ හිඟය සහ මිල ඉහළ යාම හේතුවෙන් සැපයුම්කරුට නියමිත වේලාවට භාණ්ඩ ලබා දීමට නොහැකි විය. චෙක්පත් ලියා භාණ්ඩ ලැබෙනතුරු බලා සිටී. | අංක 137 දරන මූල්‍ය රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | කෝරළෙයි පත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හෙක්ටයාර් 0.3807ක රජයේ ඉඩමක් පෞද්ගලික පුද්ගලයකුට ප්‍රදාන පදනම මත ලබාදී තිබුණු අතර ප්‍රදානය කිරීමේ කොන්දේසි උල්ලංඝනය කරමින් විදුලි සංදේශ කුළුණ ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණි. එසේ වුවද ප්‍රදාන ගිවිසුම අවලංගු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පෞද්ගලික සමාගම විසින් ඉඩම සංවර්ධනය කර ඇති බැවින් රජයේ ඉඩම් පනත යටතේ දීර්ඝ බදු දීම සඳහා බලපත්‍රය ලබාදීමට කටයුතු කර ඇත. | බදු ගිවිසුම අවලංගු කර බදු දුන් පුද්ගලයාගෙන් බදු අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනතේ 29 (අ) වගන්තියට අනුව පුද්ගලයෙකුට බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පනවා ඇති පතල් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිෂ්කාශනය කළ යුතු බවත්, රාජ්‍ය නිලධාරීන්ට, මානසික ආබාධ ඇති අයෙකුට සහ බංකොලොත්කරුවෙකු ලෙස ප්‍රකාශ කර ඇති පුද්ගලයින්ට වැලි බලපත්‍රය නිකුත් කළ නොහැකි | මේ වන විට රාජ්‍ය නිලධාරියාට සහ මානසික ආබාධය සහිත පුද්ගලයාට නිකුත් කර ඇති බලපත්‍රය නවතා ඇති අතර වැලි ගොඩදැමීම සඳහා බලපත්‍රයක් ලබා දීම සඳහා පුළුල් යාන්ත්‍රණයක් සකස් කර ඇත. | වැලි ගොඩදැමීමේ බලපත්‍ර සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපිත කර ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බවත් දන්වා තිබුණි. ඊට පටහැනිව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එවැනි පුද්ගලයන්ටද වැලි බලපත්‍ර දෙකක් නිර්දේශ කර තිබුණි. | | |
| (ආ) | කිරන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් බලපත්‍ර 52ක් නිර්දේශ කර GSMB වෙත යොමු කර ඇති අතර බලපත්‍ර 26 ක් පමණක් නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයක් සඳහා වැලි කියුබ් 167,760 ක් කැණීම සඳහා අවසර දී තිබුණ ද, අනුමත ප්‍රමාණයට වඩා වැලි කියුබ් 60,118 ක් කැණීම් කර තිබුණි. | ඒ සම්බන්ධයෙන් කටයුතු කර සමීපව නිරීක්ෂණය කරන ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට දන්වා ඇත. | බලපත්‍රයක් සඳහා කොන්දේසි ප්‍රකාරව කැණීම් කළ යුතු අතර වර්ෂයේ සිදුකරන ලද කැණීම්වලට රාජ්‍යභාග අයකළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම** | | |
| (i) | නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ උපදේශන සේවාව සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සහ නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් අතර අවබෝධතා ගිවිසුම (MOU) 2014 ඔක්තෝම්බර් 23 දින අත්සන් කර තිබූ අතර උපදේශන ක්‍රියාවලියේ විවිධ ප්‍රමාදයන් හේතුවෙන් 2015 ඔක්තෝබර් 08 දින සිට අවබෝධතා ගිවිසුම අවසන් කර තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරයා විසින් උපදේශකවරයාගේ වරද නොසලකා ගාස්තුවෙන් සියයට 40 ක් හෙවත් රුපියල් මිලියන 7.2 ක් දක්වා උපදේශකවරයාට ගෙවා තිබුණි. | මධ්‍යම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තු විසින් සකස් කරන ලද බිල්පත් ප්‍රමාණය පිළිගෙන ඇත. | ලංසු ලේඛනයේ ඇති කොන්දේසි අනුගමනය කර ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නව ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (මධ්‍යම) අතර අවබෝධතා ගිවිසුම 2015 ඔක්තෝම්බර් 14 වැනි දින අත්සන් කර තිබුණු ගිවිසුමේ 2 වගන්තිය අනුව කළමනාකරණ ගාස්තු වශයෙන් සියයට 3 ක් ගෙවිය යුතු වුවත් බිල්පත් 4 ක් දක්වා සියයට 5 ලෙස ගෙවා තිබුණි. මේ හේතුව නිසා රුපියල් මිලියන 22 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්තුව අවසන් වූ බැවින් අමතර ගෙවීම් අයකර ගැනීමට නොහැකි විය. | කරුණු විමර්ශනය කර වැඩියෙන් ගෙවා ඇති මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | **ප්‍රමාද ගාස්තු**<br>-----------------<br>2022 ජුනි මාසය දක්වා කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හෝ අඩු කිරීමට කටයුතු නොකිරීමේ ප්‍රතිඵලයක් හේතුවෙන් රුපියල් මිලියන **57** ක මුදලක් රජයට පාඩුවී තිබුණි. | අදාල කාලය සඳහා ප්‍රමාද ගාස්තු ගණනය කර තිබේ. | ප්‍රමාද ගාස්තු යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | වැඩ විචලන කටයුතු සඳහා රුපියල් මිලියන 46 ක් අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රුපියල් මිලියන 13 ක වැඩ සිදු කර නොතිබුණි | කොන්ත්‍රාත්කරු විචලන අනුමැතිය ඉල්ලා සිටියේ අපේක්ෂිත ප්‍රමාණයට මිස සැබෑ ප්‍රමාණයට නොවේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට ක්‍රියා කළ යුතුය. |

**4 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව 1,687ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 1,801ක් විය. අතිරික්ත සේවක සංඛ්‍යාව 320ක් හෙවත් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 12ක් විය. 2021 දෙසැම්බර් 31 දින වන විට පරිපාලන ග්‍රාම නිලධාරී පුරප්පාඩු 10ක්, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු 23ක් සහ ග්‍රාම නිලධාරී පුරප්පාඩු 91 ක් පැවතිණි. | ග්‍රාම නිලධාරී සහ රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරියා මෙතෙක් පත් කර නොමැත. | ඵලදායී ලෙස සේවා සැපයීම සඳහා පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් පත් කිරීමට කටයුතු කළ යුතුය. |